*සැ. යු.-* 2017.11.02 දින පළ වූ අංක 2044 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) යන කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,045 - 2017 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා - 2017.11.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2644 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2648 |



සැ. යු. - (i) ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) භාර (සංශෝධන) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 නොවැම්බර් මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අභිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙරාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06,'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2018.01.10 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තව ද, මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත. :-

| | |
|---|---|
| (*අ*) ජීවන වියදම් දීමනාව | රු. 7,800.00 |
| (*ආ*) මූලික වැටුපට හිමිවිය යුතු 40% දීමනා | රු. 5,712.00 |
| (*ඇ*) දිරි දීමනාව | රු. 1,500.00 |
| (*ඈ*) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250.00 |
| (ඉ) මූලික වැටුපෙන් 1/4 දීමනාව | රු. 3,570.00 |
| (ඊ) දුෂ්කර දීමනාව | රු. 2,000.00 |
| (උ) සංයුක්ත දීමනා (350 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) | රු. 10,500.00 |
| (ඌ) සංයුක්ත දීමනා (350 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා | රු. 8,400.00 |

මෙම දීමනාවලට අමතරව-

(*අ*) නොමිලේ ගමන් පහසුකම්

(*ආ*) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ඈ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්

(*ඉ*) රාජකාරී සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

(*ඊ*) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනිකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(*අ*) වයස් සීමාව :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 25ත් අතර විය යුතු ය. එසේ වුව ද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් කොස්තාපල් රියදුරන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 27 දක්වා අයදුම් කළ හැකිය.

(*ආ*) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතු ය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය).

***සටහන 01.-*** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාග යෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02 .-*** අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03.-*** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) ශාරීරික සුදුසුකම් :

* උස අඩි 05 යි, අඟල් 04 යි. (අවම),
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— එක් ඇසක දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) අනෙකුත් සුදුසුකම් :

අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දිනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්පත් අනුව මූලික සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණය :

| *ව්‍යායාමය* | *වාර ගණන* | *කාලය (මිනිත්තු)* |
|---|---|---|
| මීටර් 1000 දිවීම | - | 04 |
| චිනප්ස් (Chin ups) | 05 | 01 |
| පුෂප්ස් (Push ups) | 15 | 01 |
| සිටප් (Situps) | 15 | 01 |
| ස්කොට්ට්‍රස් (Scott thrush) | 12 | 01 |

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්‍ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01යි.

06. වෛද්‍ය පරීක්ෂණය :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පසුබිම් පරීක්‍ෂණය :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :

- 2007.04.28 වැනි දින රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. පත්වීමේ කොන්දේසි :

- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. සේවා කොන්දේසි :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් *පොලිස් ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2017 ඔක්තෝබර් මස 18 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

| |
|---|
| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා<br>1 1/2" x 2 ප්‍රමාණය |

**ශ්‍රී ලංකා පොලීසිය**

***ආධුනික පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය***

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (*අ*) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :————.

(*ආ*) නම (මුලකුරු සමග) :————.

(*ඇ*) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :————.
(උ) දුරකතන අංකය - නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

වයස : (*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට*)

අවුරුදු :————., මාස :————., දින :————.,

08. උස : අඩි :————., අඟල් :————., පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :
(අ) ————,
(ආ) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ සේවය කර තිබේ ද ? :————.
තනතුර සහ නිල අංකය :————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :————.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ?

එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාල නම් පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................. මයා/මිය/මෙනවිය ...................... දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රව.

තනතුර :———.

දිනය :———.

11-400

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(I)2017

1.0 2013.12.11 දිනැති හා අංක 1840/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8 ඡේදය, 15 ඡේදය අන්තර්කාලීන විධිවිධාන සහ ඇමුණුම 05 හි විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 (i) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ, II පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකරන ලද එහෙත් මෙම විභාගයෙහි (1) කාර්යාල ක්‍රම හා කාර්ය පටිපාටිය (2) රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම යන විෂයයන් එකක් හෝ දෙකම සමත් වූ හෝ නිදහස් කරන ලද නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවෙහි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි අදාළ විෂයයන්ගෙන් විෂයයෙන් විෂයයට පදනම මත නිදහස් කරනු ලැබේ.

(ii) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර II ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන් ඔවුන් II ශ්‍රේණියට උසස්වී වසර හයක් (06) ගතවීමට පෙර II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

3.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදළ නගර හා නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අයදුම්කරුවන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ. අයදුම්පත්‍රයේ අදළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. අයදුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

4.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම

සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 *සුදුසුකම්* .- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. මෙම විභාගය II ශ්‍රේණියට උසස්වී වසර තුනක් ඇතුළත සමත් විය යුතුය.

*සටහන* - මෙම *ගැසට් නිවේදනයට* සමගාමීව පළාත් රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද, අනෙකුත් අදාළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින්ද නිකුත් කරනු ඇත. ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

5.1 උපලේඛන අංක 01 - පළාත් රාජ්‍ය සේවකයන්ට අදාළ සංකේත අංක

| *පළාත* | *කේත අංකය* |
|---|---|
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 01 |
| මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 02 |
| දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 03 |
| උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 04 |
| නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 05 |
| වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 06 |
| උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 07 |
| ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 08 |
| සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 09 |

6.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 දෙසැම්බර් මස 08 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

7.0 *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* .- අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන ඇත.

8.0 (I) *අයදුම්පත්‍ර* .- ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටු වලට ද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත් පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලුම තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කර ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(II) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිඳු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද, විභාග ගාස්තු වශයෙන් විභාග කොසමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදුනොකරන බවද කාරුණිකව දන්වමි. ලදුපතේ ඡායා පිටපත් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

9.0 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපතද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදළ ලදුපතෙහි පිටපතද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ඵලදයී වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

***සටහන*** .- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාග ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

10.0 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේනතු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

13.0 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වෙනු ඇත. අදළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතු වේ. තරග විභාග නොමැතිව සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් වූ විට නිලධාරීන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. විභාගය සඳහා ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

14.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබා ගත යුතුවේ. (වැඩි විස්තර සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 05 බලන්න.)

15.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන්ම පිරවිය යුතුය.

16.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ නම් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

17.0 *විභාග පටිපාටිය*.- අයදුම්කරුවන් පහත දක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 100 යි | පැය 02 යි | 01 |
| 2. | රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම | 100 යි | පැය 02 යි | 02 |
| | *එකතුව* | *200 යි* | | |

17.1 කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය :

රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව යොදගැනීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. ලකුණු 25 යි.

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 90 යි. ලකුණු 75 යි.

17.2 රජයේ කාර්යාලවල භාවිතවන ගිණුම් ක්‍රම :

රජයේ කාර්යාලවල භාවිත වන ගිණුම් ක්‍රම, ගිණුම් පාලන පොත්පත් හා ඒ සම්බන්ධව නිකුත්කර ඇති භාණ්ඩාගාර මූල්‍ය උපදෙස් හා නියෝග පිළිබඳ දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. ලකුණු 25 යි.

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 90 යි. ලකුණු 75 යි.

18.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

19.0 "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ."

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2017 ඔක්තෝබර් මස 27 වෙනි දින,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(I)2017**

Efficiency Bar Examination for Officers' in Grade II of Public Management Assistant's Service - 2013(I)2017

(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ **ඒකාබද්ධ සේවයට අයත්** රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් පමණි.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ 5.0 ඡේදයේ සටහන බලන්න) ☐

ගැසට් නිවේදනයේ 3.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය) (මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

---

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය ඃ

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :-

| *විෂය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |
| | |

6.0 දැනට දරන තනතුර :
6.1 තනතුර :————.
6.2 පත්වීම් ලිපියේ අංකය :————.
6.3 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියට පත් වූ දිනය :————.

7.0 7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද?
7.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
7.3 තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
7.4 ලදුපත් අංකය :————.
7.5 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

8.0 අයදුම්කරුගේ සහතිකය

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ ... ...................................... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල් ................................ .............................. ක විභාග ගාස්තුව ...................... තැපැල්/උපතැපැල් කාර්යාලයට ..........................දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන.—* තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................................ මහතා/ මහත්මිය/මෙනවිය ........................................................ වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ ඇය විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
II මෙම නිලධාරියා/ නිලධාරිණිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්
III නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගය මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,
IV නිලධාරියා/නිලධාරිණිය* මෙයට පෙර විභාගයට පෙනී සිටි ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
V නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-593

---

**හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2017**

සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ජාතික විශ්වවිද්‍යාල මගින් විද්‍යාවේදී හෙද උපාධිය ලබා ඇති පහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන හා පවතින පුරප්පාඩු අනුව වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% විද්‍යාවේදී හෙද උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ.

2. *තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී හෙද උපාධිය (Bsc. Nursing) සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *කායික සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* :

(අ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ආ) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(ඇ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ඈ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඉ) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක.

(ඊ) 2017.11.24 දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(උ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය 2017.11.24 දිනට පෙර දිනයක් විය යුතුය.

4. *අයදුම්කළ යුතු ආකාරය* :

(අ) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතුය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. අයදුම්පතේ 1 සිට 2 දක්වා පළමු පිටුවේ ද 13 සිට 15 දක්වා දෙවන පිටුවේ ද 16 තෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය.

(ආ) අයදුම්කරුවන් රු 300 මුදලක් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස් කිරීම ගිණුමට බැරකර අදාළ ලදුපත් අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතුය. එම ගාස්තු කවර හේතුවක් නිසා ආපසු නොගෙවන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ රජයේ ගණකාධිකාර සේවයේ නිලධාරියෙකු/ රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සමාදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඈ) නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2017" වශයෙන් හා අදළ උපාධිය මා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට 2017.11.24 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*සටහන* - ඉහත (2) හා (3) යටතේ දක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2017.11.24 දින සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබාගත යුතුය.

6. මෙම පොදු චක්‍රලේඛයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බැංකු ලදුපත අලවා නොමැති හා 2017.11.24 දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

7. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතුරින් අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

*සටහන* -

(අ) සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගතයුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

(ආ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති

කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ, නුසුදුසු වූ තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

08. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් පහත ලියවිලිවල මුල් පිටපත් හා සත්‍ය බවට තමා විසින්ම සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) උපාධි සහතිකයේ මුල් පිටපත හා GPA අගය දක්වෙන සහතිකය (මෙම සහතිකවල සත්‍ය බවට සහතික කළ අයදුම්පත සමග එවිය යුතුය.),
(ඇ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

09. *පුහුණු කිරීමේ පටිපාටිය* :

| පාඨමාලාව | එම පාඨමාලාවේ කාලසීමාව | භාෂා මාධ්‍යය |
|---|---|---|
| හෙද අනුස්ථාපන හා සමායෝජන | මාස 06 | ඉංග්‍රීසි |

(අ) තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරිය යුතුය.

(ආ) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදයක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැක.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේද තුළ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 හි දක්වෙන විධිවිධානවලට යටත්ව සිසු හෙද/ හෙදියන්ට තෙවන වසරේදී ලබා දෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඉ) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිමකරන බවටත්, පුහුණු පාඨමාලාව අතහැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදළ තනතුරේ පත්වීම් ලද හොත් අවම වශයෙන් වර්ෂ පහක් (05) කාලපරිච්ඡේදයක් අදළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හෝ අදළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු අතර එම ගිවිසුම හා ඇපකරය පුහුණුවට ලියාපදිංචිය ලබන දිනයේම අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ශාඛාව වෙත භාරදිය යුතුය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් හෝ ඉහත (ඇ) වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද විය හියදම් හා ඇපකරයට අදළ මුදල ඔහු/ ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත් එම මුදල් අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

පුහුණුව අවසානයේ අදළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදනය කිරීම සිදුකරන/ නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදනය කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/ අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවා ගත් පාඨමාලාවට අදළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු අනුව 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛනය I හි සඳහන් MT-7-2016 වැටුප් කේතයට අදළ වැටුප මත III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ. තනතුරට පත්කළහොත් වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන ii හි දක්වෙන විධිවිධාන පරිදි බව සැළකිය යුතුය.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැළකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අතර, ඒ දෙනු ලබන පත්වීම් අවලංගුකර පුහුණුවෙන්/ තනතුරින් පහ කරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළදී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදළ පාඨමාලාව හැදෑරීම හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. මෙම පුහුණු කාල සීමාව තුළදී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාල වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට, මුදල් රෙගුලාසිවලට, හෙද ව්‍යවස්ථාවට හා එයට වරින් වර සිදු කරනු ලබන සංශෝධනවලට හා කලින් කලට බලපවත්නා රජයේ පොදු රෙගුලාසිවලට යටත්වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම් ඒ සඳහා තක්සේරු නිවාස හා කාමර කුලිය, ජලය හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම පොදු චක්‍රලේඛය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උද වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම පොදු චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ජනක සුගතදාස,
ලේකම්,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය.

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

## ආදර්ශ අයදුම්පත්‍රය

## හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2017

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පොදු චක්‍රලේඛය හොඳින් කියවා බලන්න.)

1. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම සිංහලෙන්/දෙමළෙන් :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :————.

3. තැපැල් ලිපිනය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. දුරකථන අංකය :————.

6. (අ) පදිංචි දිස්ත්‍රික්කය :————.
(ආ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද? :————

7. (අ) උපන් දිනය- වර්ෂය :————. මාසය :————. දිනය :————.
(ආ) 2017.11.24 දිනට වයස - අවුරුදු :————. මාස :————. දින :————.

8. ස්ත්‍රී/පුරුෂභාවය - ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදළ කොටුවේ X යොදන්න)

9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග
ඔව් ☐ නැත ☐ (අදළ කොටුවේ X යොදන්න)

10. විවාහක / අවිවාහක බව - විවාහක ☐ අවිවාහක ☐
(අදළ කොටුවේ X යොදන්න)

11. උස - අඩි :————. අඟල් :————.

12. අධ්‍යාපන සුදුසුකම් :

| සමත් වූ උපාධිය | උපාධිය වලංගු වන දිනය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) | විශ්ව විද්‍යාලය | අධ්‍යයන වර්ෂය |
|---|---|---|---|---|
| | | | | |

13. ඔබ කවද හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? ඔව් ☐ නැත ☐
(අදළ කොටුවේ X යොදන්න)
එසේ නම් හේතු :————.

14. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් පොදු චක්‍රලේඛය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පුහුණුවට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලද හොත් ඉන්

අනතුරුව එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බව ද මම දැනසිටිමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම, බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරණ තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

| රු. 300 ගෙවා ලබා ගත් බැංකු ලදුපත මෙහි අලවන්න. |
|---|

————.
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................... මයා/මිය/මෙනෙවිය/මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද ඔහු/ ඇය ................................................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

16. ඉල්ලුම්කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න)

ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන ............................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ ................................... තනතුර දරන බව මින් සහතික කරමි.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර මොහු/මැය පුහුණු සඳහා තෝරාගතහොත් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදළ පුහුණුවේ සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

දිනය :———.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :———.
තනතුර :———.
ලිපිනය :———.

11-566

---

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට**

***2018 වසරේ පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

සුදුසුකම් :

A. අ.පො.ස.(සා.පෙළ) විෂයයන් 06 කින් සමත් වීම.

B. 9 වසර සමත් වීම.

C. ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2 L3 සහතික ලබා තිබීම.

D. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/ වැඩ මූලික සහායක/ වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.

F. රූපලාවන්‍ය හෝ කොණ්ඩා සැකසුම් ශිල්පී NVQ Level III / IV ලබා තිබීම.

G. අ.පො.ස.(සා.පෙළ) සිංහල සම්මාන සහිතව විෂයන් 06කින් සමත් වීම

H. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

I. අ.පො.ස.(සා.පෙළ) පෙනී සිටීම.

J. අ.පො.ස. (උ/පෙළ) විෂයන් 02කින් සමත් වී තිබීම.

K. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි,ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත් වී තිබීම.

L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාල ක්ෂේත්‍රයේ නියැලී සිටීම.

M. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත් වීම හෝ NVQ Level III / IV මට්ටම සමත්වීම.

N. අ.පො.ස. (උ/පෙළ) විෂයන් 3කින් සමත් වී තිබීම.

O. අ.පො.ස. (උ/පෙළ) කලා / වානිජ විෂය ධාරාවන් හැර විෂයන් 03 කින් සමත් වීම හෝ අදාල ක්ෂේත්‍රයේ වෙනත් පාඨමාලාවක් හදාරා තිබීම සමඟ අ.පො.ස. (උ/පෙළ) විභාගයට පෙනී සිටීම.

P. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

*ප්‍රතිලාභ :*

* සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා ගාස්තු නිදහස් කර ඇත,
* දේශීය විදේශීය රැකියා අවස්ථා,
* කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්,
* ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක් විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම.

*පූර්ණ කාලීන පාඨමාලා*

| ***No.*** | ***Course*** | ***NVQ Level*** | ***Duration (Months)*** | ***Qualifications*** |
|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D |
| 2 | Computer Graphic Designer | IV | 6 | D |
| 3 | Adobe ACA - Graphic Designer | IV | 6 | D |
| 4 | CCNA Academy Programme | IV | 12 | D |
| 5 | NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | K |
| 6 | NVQ - IV in ICT(ICT Technician) - Tamil Medium | IV | 6 | K |
| 7 | NVQ - V in ICT with ORACAL Academy Certification Training | V | 12 | M |
| 8 | Computer Graphic Designer Hearing Impaired | IV | 6 | – |
| 9 | Draftperson | V | 12 | N |
| 10 | Quantity Surveying | IV | 12 | O |
| 11 | Baker | IV | 6 | A |
| 12 | Cook | III | 6 | A |
| 13 | Waiter/Steward | IV | 6 | I |
| 14 | Automobile A/C Mechanic | IV | 6 | A |
| 15 | Beautician | IV | 3 | B |
| 16 | Hair Dresser | Non | 3 | B |
| 17 | Diploma in Industrial Management | IV | 6 | E |
| 18 | Electrician | IV | 12 | A |
| 19 | Offset Lithographic Operator | IV | 6 | I |
| 20 | Machinist (CNC Milling) | IV | 6 | C |
| 21 | Machinist ( General) | IV | 12 | A |
| 22 | Pre School Teacher | IV | 12 | J |

| No. | Course | NVQ Level | Duration (Months) | Qualifications |
|---|---|---|---|---|
| 23 | Automobile Mechanic | IV | 18 | A |
| 24 | Aluminium Fabricator | IV | 6 | I |
| 25 | Special Course in Mass Communication | non | 6 | G |

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2017.12.31 දිනට වයස අවු. 17 ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක.

**NVQ III = G. C. E. O/L** සහ **NVQ IV =G. C.E.A/L** (අදාළ ක්ෂේත්‍රය තුළ)

*අර්ධ කාලීන පාඨමාලා*

| Course | Duration (Hours) | Qualifications | Course Fee (Rs.) |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 15,000.00 |
| CCNA Routing & Switching | 300 | D | 40,000.00 |
| PC Based Application Assistant (MS Office) | 100 | I | 9,500.00 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 25,500.00 |
| ICT Technician (NVQ IV) | 350 | A | 25,500.00 |
| Photographer (NVQ IV) | 298 | P | 40,000.00 |
| Auto Cad ( 2D) * | 80 | L | 7,500.00 |
| Baker (NVQ IV) | 460 | B | 36,500.00 |
| Cook | 100 | B | 14,000.00 |
| Cut & Style hair (Ladies) | 100 | B | 10,250.00 |
| Facials & skin care Treatment | 100 | B | 10,500.00 |
| Make up & Bridle Dressing | 80 | B | 11,000.00 |
| Auto Mobile Technician (Engine/ Petrol/ Diesel) * | 160 | B | 14,500.00 |
| Draughtsmanship (Building Drawing) | 150 | D | 13,500.00 |
| CNC Programming | 125 | A | 9,000.00 |
| Electrical Wiring Industrial * | 120 | A | 14,500.00 |
| Electrical Wring Domestic * | 120 | A | 13,000.00 |

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|
| Motor Control System | 100 | A | 13,000.00 |
| Automobile A/C Mechanic * | 125 | B | 13,000.00 |
| Pre School Teacher | 120 | A | 15,000.00 |
| English (NVQ I) | 200 | I | 8,400.00 |

අර්ධකාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාද/ඉරිද දිනයන්හි හා * සන්ධ්‍යා කාලීනව ද පැවැත් වේ.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2017.12.15 වැනි දිනට පෙර පහත ලිපිනයට එවන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,

අංක 354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථනය : 011-2592233
011-7277111 (IT Centre)
ඊමේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112-553856, 011-2592233

11-556

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල
දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ
වෘත්තීය විෂයයන් සඳහා සිංහල හා දෙමළ මාධ්‍යය
ගුරු පුරප්පාඩු සඳහා
ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට
උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසි ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම *ගැසට්* නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.12.11 දිනට හෝ ඊට පෙර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''වෘත්තීය විෂයයන් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017'' ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

***සටහන.***-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර තැපැල් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට හා ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කර, පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 එක් අයදුම්කරුවකුට තමා ලබා ඇති මූලික උපාධියට අදාළව උපරිම විෂයයන් 03 ක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

2.3 පුරප්පාඩු පවතින පාසල්, සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේ දී අයදුම්කරුවන්හට ප්‍රදර්ශනය කරනු ලැබේ.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන වන බැවින්, පත්කළ දින සිට අවම වශයෙන් වසර 05 ක් ගතවන තුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබාදෙනු නොලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.
ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.
iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.
v. 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව G-E-01-2016 හි රු. 27,740-300 x 6-380 x 7-445 x 2 – රු. 33,090 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. ඔබ එම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු: 32,200 හි පිහිටුවනු ලැබේ. වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමෙන ආයතනයකින් 2017.12.11 දිනට පෙර ක්‍රියාත්මක වන පරිදි උපාධියක් ලබා තිබිය යුතු අතර, ඉල්ලුම් කරනු ලබන විෂයය උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම අනිවාර්ය වේ.

***සටහන.***- පහත සඳහන් පරිදි එක් එක් විෂයයන් සම්බන්ධයෙන් එහි දක්වා ඇති සුදුසුකම් අවම සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

| *අනු අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 01 | Child Psychology and Care<br>ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | ළමා මනෝ විද්‍යාව විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක් හෝ ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 02 | Health and Social Care<br>සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණය | සෞඛ්‍යය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධිය හෝ සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක් |

| අනු. අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 03 | Physical Education and Sports<br>ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය හෝ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 04 | Performing Arts<br>ප්‍රාසංගික කලාව | ප්‍රාසංගික කලා පිළිබඳ විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රාසංගික කලා උපාධිය හෝ නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ප්‍රාසංගික කලාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 05 | Event Management<br>කාර්ය සිද්ධි කළමනාකරණය | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ කාර්යසිද්ධි කළමනාකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 06 | Arts and Crafts<br>ශිල්ප කලා | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර කලා) හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (චිත්‍ර හා ග්‍රැෆික්) හෝ දෘශ්‍ය හා තාක්ෂණික කලා උපාධිය හෝ ලලිත කලාවේදී උපාධිය හෝ ශිල්ප කලා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 07 | Interior Designing<br>අභ්‍යන්තර නිර්මානකරණය | නිර්මාණවේදී උපාධිය හෝ අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 08 | Fashion Designing<br>විලාසිතා නිර්මාණකරණය | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා) හෝ විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය හෝ විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 09 | Graphic Designing<br>ග්‍රැෆික් නිර්මාණකරණය | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර හා ග්‍රැෆික්) හෝ පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඇතුළත් උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 10 | Art and Designing<br>කලාව හා පිරිසැලසුම්කරණය | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර කලා) හෝ චිත්‍ර හා නිර්මාණය පිළිබඳ උපාධිය හෝ දෘශ්‍ය හා තාක්ෂණික කලා උපාධිය හෝ කලාව හා පිරිසැලසුම්කරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 11 | Landscaping<br>භූ දර්ශන නිර්මාණකරණය | කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය |
| 12 | Applied Horticultural Studies<br>ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 13 | Livestock Product Studies<br>පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (සත්ත්ව විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සත්ත්ව පාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 14 | Food Processing Studies<br>ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ආහාර විද්‍යාව හා තාක්ෂණ විශේෂීකරණය සහිතව) හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදී උපාධිය |

| අනු. අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 15 | Aquatic Resource Studies<br>ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ජලජීවී විද්‍යාව පිළිබඳ විශේෂීකරණය සහිතව) හෝ ජලජ සම්පත් කළමනාකරණය හා සත්තව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස ජලජ සම්පත් කළමනාකරණය විෂයය ඇතුළත් ප්‍රථම උපාධිය හෝ ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 16 | Plantation Product Studies<br>වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ අපනයන කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 17 | Construction Studies<br>ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 18 | Automobile Studies<br>මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික) හෝ විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 19 | Electrical and Electronic Studies<br>විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 20 | Textile and Apparel Studies<br>පේෂ කර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | නිර්මාණවේදී උපාධිය හෝ පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු ප්‍රථම උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 21 | Metal Fabrication Studies<br>ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය (සාමාන්‍ය) ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 22 | Aluminium Fabrication Studies<br>ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ තාක්ෂණවේදී උපාධිය සිවිල් (ඉදිකිරීම්) හෝ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 23 | Software Development<br>මෘදුකාංග සංවර්ධනය | පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය හෝ පරිගණක විද්‍යාව ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ මෘදුකාංග සංවර්ධනය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 24 | Web Designing<br>වෙබ් නිර්මාණකරණය | පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේද තාක්ෂණ විෂයය හෝ<br>පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ වෙබ් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |

| *අනු. අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 25 | Tourism and Hospitality<br>සංචරණය හා ආගන්තුක සත්කාර | ආගන්තුක සත්කාර හා විවේක කළමණාකරනය පිළිබඳව පරිපාලනවේදී උපාධිය හෝ විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය හෝ විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 26 | Environmental Studies<br>පාරිසරික අධ්‍යයනය | පාරිසරික කළමනාකරණය හෝ වන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ පරිසර සංරක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ පාරිසරික අධ්‍යයනය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |

5.2 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සෑම අයදුම්කරුවකුම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

06. *වයස් සීමාව* :

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 35 නොඉක්මවිය යුතුය.

07. *අනෙකුත් අවශ්‍යතා* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

08. *අයදුම්කිරීමේ ක්‍රමය* :

8.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතුය. 1.0 සිට 7.3 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේද 8.0 සිට ඉතිරි ශීර්ෂ අනිකුත් පිටුවලට ද ඇතුළත් වන පරිදි තම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.2 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

8.3 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 / - කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 *ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැ'යි* යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු

තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/ විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. *විභාගයට පෙනී සිටීම :*

9.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කොට විභාගයට පෙනී සිටිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

***සටහන.***- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත්වීම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සළකනු නොලැබේ.

10. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව :*

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් එක් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කල යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :*

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

12. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :*

12.1 මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් කොළඹ දී පවත්වනු ලැබේ.

12.2 ලිඛිත විභාගයෙන් සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගෙන විෂයයන් දෙකම සමත් විය යුතුය.

12.3 සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ, එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතුය.

12.4 අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

13. *විෂය නිර්දේශය :*

මෙම විභාගය පහත 13.1 හා 13.2 යන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. සියලුම අයදුම්කරුවන් එම ප්‍රශ්න පත්‍ර දෙක සඳහා පෙනී සිටීම අනිවාර්යය වේ.

13.1 *අභියෝග්‍යතාව* - කාලය පැය 01 යි (ලකුණු 100 යි)

ගුරු වෘත්තිය සඳහා අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13.2 *සාමාන්‍ය දැනීම* - කාලය පැය 01 යි (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

13.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

***සටහන***.- ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසකම් පරීක්ෂා කිරීම.

13.4 *ප්‍රායෝගික පරීක්ෂණය* :

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා විනාඩි 05 කට නොඅඩු කාලයක් ලබාදෙනු ලැබේ. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| *අනු. අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලිබව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | 25 | 10 |

***සටහන*** : ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු.
ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම.

14. විභාග ගාස්තු :

14.1 විභාග ගාස්තුව රු. 600 කි. ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ විභාග කොමසාරිස් ජනරාල් නමින් ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේම නමට ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

15. *විභාග ප්‍රතිඵල* :

15.1 ලිඛිත විභාගයේ මුලු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

16. *අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :*

අයදුම්පත පිරවීමේ දී පහත උපලේඛන 1 හා 2 පමණක් භාවිතා කරන්න.

උපලේඛනය 01

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |

උපලේඛනය 02

| විෂය කේත අංකය | විෂයය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
|---|---|---|---|
| 1 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | ✓ | ✓ |
| 2 | සෞඛ්‍යය හා සමාජ ආරක්‍ෂණය | ✓ | ✓ |
| 3 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | ✓ | ✓ |
| 4 | ප්‍රසංගික කලාව | ✓ | ✓ |
| 5 | කාර්යසිද්ධි කළමනාකරණය | ✓ | ✓ |
| 6 | ශිල්ප කලා | ✓ | ✓ |
| 7 | අභ්‍යන්තර නිර්මාණකරණය | ✓ | ✓ |
| 8 | විලාසිතා නිර්මාණකරණය | ✓ | ✓ |
| 9 | ග්‍රැෆික් නිර්මාණකරණය | ✓ | ✓ |
| 10 | කලාව හා පිරිසැලසුම්කරණය | ✓ | ✓ |
| 11 | භූ දර්ශන නිර්මාණකරණය | ✓ | ✓ |
| 12 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 13 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 14 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 15 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 16 | වැවිලි බෝග නිෂ්පාදන තාක්‍ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 17 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 18 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 19 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 20 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 21 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 22 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | ✓ | ✓ |
| 23 | මෘදුකාංග සංවර්ධනය | ✓ | ✓ |
| 24 | වෙබ් නිර්මාණකරණය | ✓ | ✓ |
| 25 | සංචරණය හා ආගන්තුක සත්කාර | ✓ | ✓ |
| 26 | පාරිසරික අධ්‍යයනය | ✓ | ✓ |

17. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත්‍රයේ අංක 12. ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

18. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

19. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර, පසුව ඉදිරිත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

20. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිති ද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ.

21. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,

2017 නොවැම්බර් මස 10 වැනි දින,
පැලවත්ත, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***අධ්‍යාපන අමාත්‍යාංශය***

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

*දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ වෘත්තීය විෂයයන් සඳහා සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017*

01. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා උපලේඛන 1 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ යොදන්න.
භාෂා මාධ්‍යය :

02. ඉල්ලුම් කරනු ලබන විෂයයන් සඳහා විෂය කේත අංක අනුව උපරිම විෂයයන් 03ක් නම් කරන්න.
(උපලේඛනය 2 භාවිතා කරන්න.)

| | *විෂයය* | *විෂයය කේත අංකය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

03.

3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා : AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH ) :——.

3.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (උදා : HERATH. A. M. N.) :———.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

04. වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :———.

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) පුරුෂ - 0

07.

7.1 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

7.2 උපන් දිනය වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

7.3 2017.12.11 වැනි දිනට වයස : අවු. : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. *අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :*

| අ. පො. ස. (සා. පෙළ) විභාගය | | | | අ. පො. ස. (උ. පෙළ) විභාගය | |
|---|---|---|---|---|---|
| වර්ෂය :- | විභාග අංකය :- | | | වර්ෂය : | විභාග අංකය:- |
| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

09. *උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :*

9.1 උපාධිය :————.
9.2 නිකුත් කළ විශ්ව විද්‍යාලය :————.
9.3 උපාධිය වලංගු දිනය :————.
9.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
9.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

10. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳව විස්තර :*

10.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් : (අකුරින්) :————.
10.2 කුවිතාන්සියේ අංකය :————.
10.3 නිකුත් කළ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
10.4 දිනය :————.

| |
|---|
| මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.<br>මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි එක් දරයකින් මෙහි අලවන්න. |

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව මෙම තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ........................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

.

තනතුර :————.

ලිපිනය :————.

12. *අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :-

....................... මහතා/මහත්මිය/මෙනෙවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු /සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11-524

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.